## ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2017

---------------------------------------------------------------------

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 මතය
-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**
-----------------------------------------

(අ) ප්‍රමිතයේ 42 ඡේදය ප්‍රකාරව සියයට 100 ක් ක්ෂය කර ඇති වත්කම්වල සාධාරණ අගයන් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වුවද ආයතනය විසින් 2017 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති පිරිවැය රු.479,508 ක් වූ පොත් හා වාර ප්‍රකාශන වලින් තව දුරටත් භාවිතා කරනු ලබන පොත් හා වාර ප්‍රකාශනවල සාධාරණ අගය (Fair Value) ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 86 වන ඡේදය ප්‍රකාරව සියලු ස්ථාවර වත්කම්වල වාර්ෂික ක්ෂය අනුපාතයන් හෙළිදරව් කළ යුතු වුවද ආයතනයේ යන්ත්‍ර සහ සවිකිරීම් (Plant and Machinery) වල ක්ෂය අනුපාතය එසේ හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්
--------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන වටිනාකම රු.46,761,464 ක් වූ අතර උපලේඛනවලට අනුව එම වටිනාකම රු.47,031,800 ක් වූයෙන් රු.270,336 ක පැහැදිලි නොකල වෙනසක් විය.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති, රිතී, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීම සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. පැමිණීම තහවුරු කරගැනීමකින් තොරව 2017 වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබූ මුදල රු.9,183,656 ක් විය. |

| | | |
|---|---|---|
| (ආ) | 2011 ජනවාරි 27 දිනැති අංක PED 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | යම් රාජ්‍ය ආයතනයක අතිරික්ත අරමුදල් පවතී නම් ඉදිරි මාස 06 සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හැර ඉතිරිය භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,110,775 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,584,286 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,526,489 ක වර්ධනයක් සිදුවී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.6,541,098 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.3,413,496 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.2,400,723 ක් දක්වා පිරිහී තිබූ අතර එතැන් සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය වන විට රු.10,110,775 ක් වී තිබුණි. ඉහත අතිරික්තයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු.8,819,530 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.21,075,415 ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1 කාර්යසාධනය**

------------------

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

--------------------------------------

ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම පෙරදැරි කරගෙන රටේ සංවර්ධනය සඳහා දායක වන මූල්‍යමය හැකියාවක් ඇති ආයතනයක් බිහිකිරීමේ අරමුණෙන් 2006 වසරේදී මෙම ආයතනය ස්ථාපිත කර තිබුණි. ආයතනය ආරම්භ කළ 2006 වසරේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 39 හා 09 ක් විය.පසුගිය වසර 03 ක කාලය තුළ කිසියම් ප්‍රගතියක් දක්නට ලැබුණද ආයතනයේ ආරම්භක අරමුණු ඉටුකර ගැනීමට සිදුකර ඇති දායකත්වය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට තවදුරටත් නොහැකි වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

------------------------------

විවෘත විශ්වවිද්‍යාලයට අයත් ඉඩමක අයිතිය නිත්‍යානුකූලව ලබා නොගෙන රු.91,591,024 ක් වැයකර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලද මුදල් වලින් අදාළ වර්ෂයන්හි උපයෝජනය නොකළ ප්‍රදානයන් සැලකිල්ලට නොගෙන නැවත නැවතත් ඉල්ලීම් කර ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලබාගෙන තිබුණි. ඒ හේතුවෙන් 2015, 2016 සහ 2017 වර්ෂවල එලෙස භාණ්ඩාගාරයෙන් ලද මුදල් වලින් පිළිවෙලින් රු.44,676,212 ක්, රු.35,829,434 ක් හා රු.17,189,312 ත් ඉතිරිව පැවතුණි. මෙලෙස ඉතිරි වූ මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.46,761,464 ක් කෙටිකාලීන ආයෝජනවල යොදවා තිබුණි.

(ආ) ආයතනයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීමට සිදුවන කාලසීමාවන් පුරෝකථනය කර ඒ අනුව කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හඳුනාගෙන අතිරික්ත මුදල් ශේෂයන් කෙටිකාලීන ආයෝජනයන්හි යෙදවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 03 කට ආසන්න ශේෂයක් බැංකු ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම්වල අඛණ්ඩව පැවතුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.10,314,906 ක් ගෙවා තිබුණි. එහෙත් ආයතනය විසින් පවත්වන ලද දේශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ වලින් සියයට 85 කටත් අධික ප්‍රමාණයක් පවත්වා තිබුණේ සති අන්ත දිනවලය. ඒ සඳහා බාහිර දේශකවරුන්ට රු.841,250 ක් ආයතනයේ දේශකවරුන්ට රු.290,000 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ලෙස රු.276,704 ක් ගෙවා තිබුණි.

(ආ) ආයතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම දේශන පැවැත්වීම සති අන්ත දිනවල සිදුකර තිබුණි. ඒ අනුව අනෙකුත් විශ්වවිද්‍යාල මෙන් සතියේ දිනවල අධ්‍යයන කාර්ය මණ්ඩලය දේශනාවල නියැලී නොමැති බවත් මුළු දේශකවරුන්ගෙන් සියයට 75 ඉක්මවූ දායකත්වයක් බාහිර දේශකවරුන් ගෙන් ලැබී ඇති බවත් නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

------------------------

විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් මෙම ආයතනයේ විගණනය සිදුකළද මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම වැනි අඩුපාඩු අවම කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය සැලසුම් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛණමය පාලනය**

----------------------------------

අයවැය ගත ආදායම් හා වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 60 සිට සියයට 307 දක්වා ප්‍රමාණාත්මක විචලනයක් දක්නට ලැබුණු බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | i. ප්‍රාග්ධන ප්‍රදාන නිසිපරිදි උපයෝගි කර නොතිබීම.<br>ii. අතිරික්ත මුදල් කෙටිකාලීන ආයෝජන වල නොයෙදීම. |
| (ආ) | අභ්‍යන්තර විගණනය | ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණනය උපයෝගී කර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබීම. |
| (ඇ) | අයවැය පාලනය | පසුගිය වර්ෂවල ආදායම් හා වියදම් සමාලෝචනය කර ඇස්තමේන්තු සකස් කර නොතිබීම. |
| (ඈ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතැම් වත්කම්වල මිලදීගත් දිනය, පිරිවැය සටහන් කර නොතිබීම සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අතර නොසැසඳීම් පැවතීම. |